**මහඔය ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 වැනි දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 18 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජනවාරි 06 දින සභාවේ සභාපතිවරයාට යවන ලදි.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මහඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.**

2014 ජනවාරි 27 දිනැති අංක පීඑල්/05/බීජ්/ශ්‍රීලරාඅගිප්‍ර දරන පලාත් පාලන සහ පලාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) කඩකුලී ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ කඩකුලී ආදායම රු. 1,591,850 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවලට රු. 1,477,850 ක් ලෙස ගෙන තිබුණි. ඒ අනුව කඩකුලී ආදායම රු. 114,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඉදිරිපත් වූ තොරතුරු අනුව සමුච්චිත අරමුදල් ශේෂය රු.3,439,117 ක් විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.3,434,482 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සමුච්චිත අරමුදල රු.4,635 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛණය අනුව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම සහ මෝටර් රථ හා කරත්තවල වටිනාකම් හි එකතුව රු.26,860,327 ක් වුවද ශේෂ පත්‍රයේ එම වටිනාකම්වල එකතුව රු.45,753,577ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ස්ථාවර වත්කම්වල වටිනාකම රු.18,893,250 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) රු.80,022 ක පුස්තකාල සාමාජිකයන්ගෙන් අයකරගෙන තිබූ ආපසු ගෙවිය යුතු වූ තැන්පතු මුදල් වැරදි ලෙස සමුච්චිත අරමුදලට මාරුකර තිබුණි.

(ඉ) ඉදිරිපත් වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු ආදායම රු.312,550 ක් විය යුතු වුවද, එය ශේෂ පත්‍රයට රු.103,250 ක් ලෙස ගෙන තිබුණි. ඒ අනුව හිඟ මුද්දර ගාස්තු ආදායම ශේෂ පත්‍රයේ රු.209,300 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ඉදිරිපත් වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය මුදල රු.148,709 ක් හා හිඟ ණය පොලිය රු.922,404 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.6,050,494 ක් හා රු.1,010,924 ක් ලෙස සටහන් වී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර ආදායම, ආදායම් ලේඛනය අනුව රු.285,250 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.389,600ක් ලෙස රු. 104,350 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

----------------------------------------

ඉඩම් හා ගොඩනැගිලි රු. 32,106,327 ක් ද , යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු. 1,366,506 ක් ද, මෝටර් රථ හා කරත්ත රු. 13,647,250 ක් ද, ලී බඩු සවිකිරීම් රු. 2,382,345 ක් සහ කාර්යාල උපකරණ රු. 26,770 ක් වශයෙන් එකතුව රු.39,533,198 ක් සඳහා ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් නොකළ බැවින් එම වටිනාකම් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 **නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති සහ රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | |
| මු.රෙ.757 (4) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා පිටපතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) <u>ප්‍රාදේශීය සභා රීති මාලාව</u> | |
| රීති 153 | හිඟ ආදායම් මුදල් පිළිබඳ ප්‍රකාශනයක් පි.එස් 07 ආකෘති පත්‍රය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අදායම රු.1,103,267ක් වූ අතර, ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ අදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.459,225ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,562,492 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,000 | - | - |
| කුලී | 2,796,900 | 3,105,860 | 225,276 |
| බලපත්‍ර ගාස්තු | 415,000 | 392,770 | - |
| සේවා සඳහා ගාස්තු | 1,685,000 | 2,258,035 | - |
| වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 455,000 | 1,589,918 | 629,000 |
| වෙනත් ආදායම් | 164,000 | 302,606 | - |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.525,750 ක් නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතුව තිබුණ ද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මුද්දර ගාස්තු වශයෙන් රු.312,550 ක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතුව තිබුණ ද එම මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**--------------------------------------**

3.1 **අයවැය පාලනය**

**-----------------**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 15 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් පැවැති බැවින්, සඵල කළමණාකරන පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4. **පද්ධති හා පාලන**

**-------------------**

විගණනයේ දී නිරීක්ෂනය වූ පරිදි පහත සඳහන් පද්ධති හා පාලන සම්බන්ධව අඩුපාඩු පිළිබඳ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ණය මුදල් අයකර ගැනීම

(ඈ) අයවැය ලේඛණය

(ඉ) ලේඛණ පවත්වාගෙන යාම